



# ABHIMANI
The Empowered Woman

## දිවියට දිරියෙන් ලෙළදෙන අභිමානයේ ධජය ඔබයි

## 2023

MAS
දිරියෙන් ඉදිරියට

# ජසින්තා: යමක් හරියට කිරීම පළපුරුද්දයි

කිලිනොච්චිය නගරය අවට ඇඟලුම් කර්මාන්තශාලා පිහිටුවීම, පළාතේ තරුණ තරුණියන්ට මහත් අස්වැසිල්ලක් විය. මෙම නවීන ඇඟලුම් කර්මාන්තශාලාවලට බොහෝ තරුණ තරුණියන් ඉතා කැමැත්තෙන් රැකියා සොයා පැමිණෙන්නට විය. 2013 වසරේ මමත් මේ VIDIYAL ආයතනයට පැමිණියේ රැකියාවක් සොයාගැනීම සඳහාය. මම මුලින්ම සේවය සඳහා බඳවාගනු ලැබුවේ නිෂ්පාදන අංශයේ කණ්ඩායම් සාමාජිකාවක ලෙසයි. නිෂ්පාදන පේළියේ නිමවන අසාමාන්‍යතා සහිත ඇඟලුම් තෝරා බේරා වෙන් කර තැබීම මට පැවරුණු රාජකාරියයි. 2016 වනවිට ඒ නිෂ්පාදන අංශයේම කණ්ඩායම් නායිකාවක ලෙස පත් කෙරුණි. කණ්ඩායමේ ප්‍රශ්න සහ ගැටලු විසඳීමත්, නිෂ්පාදන ක්‍රියාවලියේ අඩුපාඩු සොයාබැලීමත්, එදිනෙදා නොදන්වා සේවයට නොපැමිණෙන සාමාජිකාවන් සොයාබලා ඔවුන් හඳුනාගෙන දිනපතා සේවයට පැමිණීමේ අවශ්‍යතාව අවබෝධ කර දී එයින් ලැබිය හැකි ආර්ථික ප්‍රතිලාභ හඳුන්වා දී ඒවා ලබාගෙන දියුණුවන ආකාරයත් පැහැදිලි කරදීම මගේ වගකීම විය. මේ ආකාරයෙන් මම සේවයේ පළපුරුද්ද ලැබූ නිසා අද වනවිට සමූහ කණ්ඩායම් නායිකාවක් වී කණ්ඩායම් කීපයකම සාමාජිකාවන් රැසකට නායකත්වය ලබා දීමට හැකියාව ලබා ඇත. මෙම තනතුරට පත්වීමත් සමග මගේ ආර්ථික ශක්තිය වර්ධනය කරමින් වැටුප් තලයද ඉහළට ගොස් තිබුණි. එසේම වගකීම්ද වැඩිවී තිබුණි. ඒවානම් මානව සම්පත් අංශයට සහයෝගය ලබාදීම, නිෂ්පාදන තත්වයන් විමසා බැලීම, yamazumi ගැටලු විසඳීම SQDCM Monitor කිරීම සහ නිෂ්පාදන පේළි සමබර කර පවත්වාගැනීමත් මට පැවරී තිබූ කාර්යන්ය.

මේ ආකාරයෙන් දිගින් දිගටම සේවා අත්දැකීම් ලබාගෙන 2025 වසර වනවිට VSE තනතුර දක්වා ළඟාවීම මගේ රැකියා ජීවිතයේ ඉහළම බලාපොරොත්තුවයි. ඒ සඳහා අවශ්‍ය පරිගණක සාක්ෂරතාව සහ ඉංග්‍රීසි සිංහල භාෂාමය හැකියාව දියුණු කර ගැනීම සඳහා MAS Intimates Vidiyal ආයතනයෙන් පවත්වන ඉංග්‍රීසි පංතියට සහභාගි වෙමි.
මේ අතර යාපනය විවෘත විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිලිබඳව උපාධිය ලබාගැනීමට 2025 අප්‍රේල් වනවිට ලියාපදිංචි වීමට බලාපොරොත්තු වෙමි.

පෞද්ගලිකව මගේ විවාහ කටයුතු සඳහා අවශ්‍ය රත්තරන් ආභරණ සියල්ලම සාදා ගත්තෙමි. මගේම කියා නිවසක් ගොඩනැගීමේ කටයුතු 2022 වසර වනවට ආරම්භ කළෙමි. මේ වසර ඇතුළත එම නිවස සාදා නිමකළ හැකි වනු ඇත. 2027 වසර වනවිට මෝටර් රථයක් මිලදී ගැනීමට සිහින මවමි.

සමාජ මෙහෙවර වශයෙන් දැනටමත් මගේ ගමේ ආර්ථික අපහසුතා ඇති ළමුන් හතරදෙනෙකුට ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු දියුණු කර ගැනීම සඳහා අවශ්‍ය මුදල් පහසුකම් ලබාදෙන අතර 2025 වසර දක්වාම එම කටයුතු දීර්ඝකර ක්‍රියාත්මක කරමි. MAS ආයතනයෙන් ලබාදුන් P.A.C.E. පුහුණුවත්, ඉංග්‍රීසි පුහුණුවත්, ශිල්ප යාත්‍රා පුහුණුවත් මට විශාල ශක්තියක් සහ ධෛර්යයක් විය. P.A.C.E. වැඩසටහනින් සන්නිවේදන හැකියාවත්, මූල්‍ය කළමනාකරණයත් ඉගෙන ගැනීමට හැකි විය. එසේම ශිල්ප යාත්‍රා වැඩසටහනෙන්, කණ්ඩායමේ දක්ෂතා ඇති අයවලුන් හඳුනාගැනීමට හැකිවුණි. මගේ ජීවිතයේ ධනාත්මකව වෙනසක් ඇතිකරගෙන රැකියා ජීවිතයත් පෞද්ගලික ජීවිතයත් සමබරව පවත්වාගෙන යාමට ආයතනය විවිධාකාරයෙන් උපකාර කළ බව ප්‍රශංසාත්මකව පවසමි.




**ජසින්තා කපිලන්**

MAS Intimates - Vidiyal



# කාංචනා: මානව සම්පත් කළමනාකරණයට කැමැත්තෙන්

සාර්ථක දිවියක් ඇරඹීමේ අරමුණින්, ඒ සඳහා අත්වැලක් ලෙස 2014 වර්ෂයේදී MAS Silueta බියගම ආයතනයට ඇය සම්බන්ධ වන්නේ කණ්ඩායම් නායිකාවක වශයෙනි. කණ්ඩායමක් ලෙස නිෂ්පාදන ඉලක්ක සපුරාලීමට දායක වීම ඇගේ කාර්යය විය. 2018 වර්ෂයේදී සමූහ කණ්ඩායම් නායිකා තනතුරට උසස් කරන ලදුව ඇය කණ්ඩායම් 4ක නිෂ්පාදන ඉලක්ක සපුරාලීම සඳහා තම සහායිකාවන් මෙහෙයවූවාය. 2019 වසරේදී ඇය MEC ආයතනයට මාරුවීමක් ලබාගත් අතර කණ්ඩායම් සාමාජිකාවක ලෙස සේවය කළාය. 2023 වසර වන විට සමූහ කණ්ඩායම් නායිකාවක වූ ඇය කළමණාකාරිත්වය මගින් ලබාදෙන ලද සාම්පල් එකෙහි SMV Saving එකක් සිදුකළාය.

කෙටිකාලීන ඉලක්කයක් වශයෙන් නිෂ්පාදන අංශයේ staff තනතුරට පත්වීමට අපේක්ෂා කරන ඇය ඒ සඳහා තම සුදුසුකම් සපුරන්නීය. නායකත්වය පිළිබඳව දැනුම සහ මානව සම්පත් කළමනාකරණය පිළිබඳව දැනුම ලබාගැනීම සඳහා ඇය GIMI ආයතනයේ Executive and Management ඩිප්ලෝමාවක් හදාරා ඇත. ආයතනය මගින් පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන් සඳහා අඛණ්ඩව සහභාගි වන ඇය ස්වයං අධ්‍යයනය තුළින්ද තම දැනුම වර්ධනය කරගන්නීය. MOS Lean පිළිබඳව දැනුමද, ඉංග්‍රීසි හා පරිගණක දැනුමද ඇය වර්ධනය කර ගනිමින් සිටින්නීය. ඇගේ දිගුකාලීන ඉලක්කය වන්නේ නිෂ්පාදන කළමනාකාර තනතුරට පත්වීමයි. Sewing Flow Management පිළිබඳව පූර්ණ දැනුමක් ලබාගැනීමට ඇය බලාපොරොත්තු වන්නීය.

කණ්ඩායමක් ලෙස සැලසුම් කරන ලද ඉලක්ක ළඟාකර ගැනීම, දිනපතා සේවයට ගෙන්වා ගැනීම, නිම කරන ලද නිෂ්පාදනවල ගුණාත්මකභාවය රැකීම, style මාරුවීමේදී ගතවන කාලය අඩුකර ගැනීම වැනි නිෂ්පාදනය නංවාලන නව්‍ය ක්‍රම ඇය හඳුන්වා දුන්නීය. FN 2289 Fashing Free O/L කිරීමේදී uneven වීම වැළැක්වීම සඳහා Fashing Attach Seam එක සහ Gang එක අතර Seam Width එක 1.5cm තබා foot එකට gauge එකක් සවිකිරීම මගින් uneven වීම වැළකී smooth production එකක් කිරීමේ හැකියාව දියුණු කිරීම, FIX 2289 Fashing Outline එක මැසීමේදී seam හැරවීම පහසු කිරීම සඳහා gauge එකක් දැමීම මගින් නිෂ්පාදනයේ ගුණාත්මක බව වැඩිකර ගත හැකි වීම මගින් ආයතනයට සේවයක් කළාය. සමාජයේ කැපී පෙනෙන ව්‍යාපාරයක හිමිකාරියක් වීමද, වෑන් රථයක් මිලදී ගැනීමද, දරුවන්ට මනා අධ්‍යාපනයක් ලබාදී සමාජයට වැඩදායී පුද්ගලයන් බවට පත්කිරීමද ඇගේ පෞද්ගලික ඉලක්ක වේ. ඇය දැනට Nethu Fashion නමින් ඇඟළුම් ව්‍යාපාරයක්ද පවත්වාගෙන යන අතර එයින් අමතර ආදායමක් උපයා ගනියි.

මේ හැරුණුවිට DNA පිළිබඳව දැනුවත් කිරීමේ නාට්‍ය සඳහා සහභාගි වූ අතර අවුරුදු උත්සවවලදීද ආයතනය තුළ විකට ඇඳුම් තරඟ ජයග්‍රහණ ලබා ඇත. නත්තල් සැරසිලි තරඟ සඳහාද ඇය ඉදිරිපත් වී ඇති අතර වෙසක් කූඩු තරඟ සඳහාව සහභාගි වී ඇත. ආයතනයේ විවිධ උත්සව අවස්ථාවන්හි නිවේදන කටයුතු සඳහාද එක්වී ඇත. CSR වැනි සමාජ මෙහෙවර කටයුතුවලදී මූලිකත්වය ගත් අතර, Future Star තරඟාවලි සඳහා සහභාගි වී ජයග්‍රහණ ලබා ඇත.




**කාංචනා දිල්රුක්ෂි**

MAS Kreeda - Campus



# කෞශල්‍යා: අනෙකාගේ ආත්ම ගෞරවය ඇතිවන ආකාරයෙන් වැඩ

නුපුහුණු කණ්ඩායම් සාමාජිකාවක වශයෙන් 2016 වසරේදී Sleekline ආයතනයට සම්බන්ධ වුණෙමි. 2017 දී පුහුණු කණ්ඩායම් සාමාජිකාවක ලෙසත්, 2020 වසර වන විට නුපුහුණු කණ්ඩායම් නායිකාව ලෙසත්, 2021 වසරේදී පුහුණු කණ්ඩායම් නායිකාවක ලෙසත් පත් වුණෙමි. ඉතා කෙටි කාලයකින් මම ඉගෙන ගන්න ලැබුණු හැම දෙයක්ම සතුටින් සහ උවමනාවෙන් ඉගෙන ගතිමි. එමගින් කණ්ඩායමේ සාමාජිකයින් සමග සුහදව සහයෝගයෙන් සෙසු සාමාජිකාවන් සමග එක්ව ආයතනික වගකීම ඉටුකරමින් නියමිත කාලයට අපේ නිෂ්පාදන නැව්ගත කිරීමට අවශ්‍ය සෑම කටයුත්තක්ම නොපිරිහෙලා සිදුකළා. ඒ සඳහා මට මහත් සේ උපකාරී වුණේ ආයතනය මගින් ලබාදුන් MOS Lean Tools භාවිතය පිළිබඳව ලබාදුන් පුහුණුව සහ TL/GL පුහුණුවයි. පියවර පුහුණු වැඩසටහන මාව සම්පූර්ණ වෙනස් තැනකට ගෙන ගියා කිවහොත් නිවැරදියි. මගේ අත්දැකීම අනුව ගැටලුවක් විසඳූ ආකාරය කතාවක් ඉදිරිපත් කිරීමෙන් එම වැඩසටහනේ Batch Top බවට පත් වීමට හැකියාව ලැබුණි.

MAS Active Sleekline ආයතනයෙන් ලැබුණු සෑම පුහුණුවකින්ම විශාල දැනුම් සම්භාරයක් ලබාගැනීමට හැකිවූ අතර ඒවා ආයතනයේ දියුණුවට මෙන්ම මගේ පෞද්ගලික ජීවිතයේ දියුණුවද ඇතිකර ගැනීම සඳහා ඉමහත් පිටුවහලක් විය. ආයතනයේ නූල් නාස්තිය නැවැත්වීමට Kaizen එකක් ඉදිරිපත් කර එමගින් ආයතනයට විශාල මුදල් ප්‍රමාණයක් ඉතිරි කර දීමටද මට හැකි විය. එම STW Kaizen එක මගේ නිර්මාණයකි.

කණ්ඩායමේ සියලුමදෙනා ගැන නිවැරැදි අවබෝධයක් මට ඇත. ඒ නිසා සෑම ප්‍රශ්නයකදීම ගැටලුවකදීම කණ්ඩායම රැස් කර සියලුදෙනාගේ අදහස් විමසා සුදුසු පියවර ගැනීම මගේ සිරිතයි. එකිනෙකාගේ ශක්තීන් හොඳින් හඳුනාගෙන ඒ අය සමග ගැටලු සාකච්ඡා කරන අතර යම් යම් දුර්වලතාවයන් ඇති අවස්ථාවන් ද හඳුනාගෙන කණ්ඩායමේ දවසේ නියමිත වැඩ ප්‍රමාණය නිම කරවා දෙමි. ඉවසීම, සුහදශීලී බව, අවබෝධය තුළින් අනෙකාගේ ආත්ම ගෞරවයට හානි නොවන ආකාරයට කණ්ඩායම මෙහෙයවා ගැනීමට හැකිවීම නිසා මාගේ රාජකාරිය කිරීමට පහසු වී ඇත. එමගින් කාර්යක්ෂමතාවය වැඩිකරගෙන සාමාජිකාවන්ට නිෂ්පාදන දිරි දීමනාවන්ද ලබාගැනීමට පහසු කර ඇත. කණ්ඩායමේ සාමාජික සාමාජිකාවන් අතරින් අයෙකුට පෞද්ගලික හේතුවක් නිසා සේවයට පැමිණීම අපහසු වුවහොත් එම ගැටලුව විසඳා දී ඇය හෝ ඔහු සේවයට කැඳවාගැනීමට ක්‍රමයක් සකස් කරමි. සමහරවිට යම් යම් හේතු නිසා දවසේ නියමිත වැඩ ප්‍රමාණය නිම කළ නොහැකි සාමාජිකාවන් හට පෞද්ගලිකව උදව් කර යහපත් වැඩ පරිසරයක් නිර්මාණය කර ඇත.

මගේ පෞද්ගලික ජීවිතයේ එකම බලාපොරොත්තුව, නිවස අංග සම්පූර්ණව සාදා නිම කිරීමයි. එමෙන්ම දරුවාගේ අධ්‍යාපන කටයුතු නොඅඩුව සලසා දීමයි. දෙමව්පියන් සහ සහෝදරයාගේ දියුණුව වෙනුවෙන් සැමවිටම උදව් කිරීමට බැඳී සිටිමි. මා මෙන් තවත් කාන්තාවන්ට ජීවිතය සාර්ථක කර ගැනීමට උදව් කිරීමත්, සමාජයේ විවිධ අපහසුතා සහිත කාන්තාවන්ට ඔවුන්ගේ ගැටලු විසඳාගැනීමට උදව්කිරීමත් සමාජ සේවාවක් ලෙස කරමි.




**කෞශල්‍යා නිශාමනී**

MAS Active - Sleekline



# ලසන්ති: ජීවන බාධා මැද දිවිය ජයගත් කාන්තාව

දැඩි ජීවන අරගලයක අවසානය සනිටුහන් කරමින් වසර 2000 දී බොඩිලයින් පිඹුර ආයතනයට ලසන්ති බැඳුණේ End Controller ලෙසිනි. එයින් අනතුරුව 2003 වසරේදී එම ආයතනයෙහිම තත්ත්ව පරීක්ෂිකාවක ලෙස උසස්වීම් ලබා 2012 වසර වන විට ප්‍රධාන සුපවයිසර්වරියක වීමට ඇයට භාග්‍යය උදාවිය. එහිදී EFI Quality Delivery සඳහා මනා සහායක් දැක්වූවාය. 2017 වසරේදී Training Instructor ලෙස උසස්වීමක් ලද අතර කණ්ඩායම් සහායිකාවන් පුහුණු කිරීමට ඇයට අවස්ථාව හිමිවිය.

ඇය නුදුරු අනාගතයේදී විධායක නිලධාරිනියක වීමට අපේක්ෂා කරන්නීය. ඒ සඳහා අවැසි දැනුම හා අත්දැකීම් ඇය රැස් කරමින් සිටින්නීය. ඇය T.P.M. පිළිබඳව පුහුණුවක් ලද අතර J.I.T. පුහුණුවද ලබාගත්තාය. Fundamental Activities පිළිබඳවද පුහුණුවක් ලබා ගත් ඇය, Bodyline ආයතනය මගින් ලබාදුන් සියලුම පුහුණුවීම් සඳහා සහභාගි වූවාය. තවද STW පිළිබඳවද පුහුණුවක් මේ වන විට ලබා සිටියි. 2012 වසරේදී ''ධනාත්මක ආකල්ප'' යටතේ වසරේ විශිෂ්ටතමයා වීමටද ඇයට හැකි විය.

ඇය පිඹුර Bodyline ආයතනයට සම්බන්ධ වන විටත් අ.පො.ස උසස් පෙළ සමත්ව සිටි නිසා ආයතනයෙන් ලබාදෙන හැම පුහුණුවක්ම පහසුවෙන් අවබෝධ කරගැනීමට හැකිවිය.

මුලදී දුක් ගැහැට වලින් පිරී ජීවිතයක් උරුම කරගෙන සිටි ඇය නිතරම ධනාත්මක ආකල්ප සංවර්ධන කර ගනිමින් පවුලේ යහපත ගැනම සිතා කටයුතු කළාය. තම මාසික වැටුපෙන් ඉතිරි කරගත් මුදලින් ඇය මුල්ම පෞද්ගලික ඉලක්කය ඉටුකර ගනිමින් ඉඩමක් මිලට ගෙන එහි නිවසක් ගොඩනැගුවාය. තම ස්වාමියාගෙන් නිසි හවිහරණක් නොලැබුණත් දරුවන් දෙදෙනාගේම අධ්‍යාපන කටයුතුවලට සැමවිටම උපරිම උදව් කළාය. සොයා බැලුවාය. එහි ප්‍රතිඵලය වූයේ වැඩිමහල් දියණිය උසස් පෙළ සමත් කර විවිධ පාඨමාලාවන්ද හදාරවා පසුව බැංකුවක රැකියාවකට යොමු කරගැනීමට හැකිවීමයි.

මේ අතරතුර ඇගේ සහෝදරයාගේ බිරිඳ වියෝවීම නිසා ඒ දරුවාත් රැකබලාගෙන ඉගැන්වීම් කටයුතු කරවන්නට ඇයට සිදුවිය. ඉන් අනතුරුව මෝටර් බයිසිකලයක් මිලට ගත්තේ ප්‍රවාහන පහසුව සඳහාය. ඇය අත ඉතිරිවූ මුදල් එකතුකර වෑන් රථයක් මිලට ගෙන සැමියාට රැකියාවක් වශයෙන් එහි රියදුරුකම ලබාදී පෞද්ගලික ආයතනයක ප්‍රවාහනය සඳහා යෙදවූ අතර කලක් ඇවෑමෙන් තවත් වෑන් රථයක් මිලට ගෙන එයට රියදුරෙකු යොදවා ඇඟලුම් කර්මාන්තායතනයක Staff Service එකකට යෙදෙව්වේ ඇගේ පෞද්ගලික ආදායම වැඩිදියුණු කර ගැනීමටය. ඇගේ ඊළඟ ඉලක්කය පෞද්ගලික ගමන්බිමන් සඳහා කාර් රථයක් මිලට ගැනීමයි. කලකට පෙර සැමියාගේ ඉඩමක රබර් පැළ වගාවක් දැමූ ඇයට එහි ප්‍රතිඵල ලබාගත හැකි කාලයද පැමිණ ඇත.

ගමේ රැකියා නොමැති කීපදෙනෙකුට රබර් වත්තේ කිරි කැපීමට රැකියා සපයා දී යම් සමාජ මෙහෙවරක් කිරීමද ඇගේ සිතුවිල්ලයි. ආහාරපාන සකස්කර අලෙවි කිරීමේ කුඩා ව්‍යාපාරයක් අනාගතයේදී විවෘත කිරීමට සැලසුම් කරන ලසන්ති විවේක කාලය ප්‍රයෝජනට ගනිමින් ගෙවත්ත අලංකාරය සදහා විසිතුරු මල්වර්ග සහ පැලවර්ග වගා කරමින් ඉතා සතුටින් ජීවිතය ගතකරයි.




**ලසන්ති ප්‍රියංගා සිල්වා**

Bodyline - Pimbura



# ලීසා: හජ් වන්දනාව ප්‍රමුඛ ඉලක්කයක්

නිෂ්පාදන කණ්ඩායම් සාමාජිකාවක වශයෙන් මං රැකියාවට සම්බන්ධ වුණු මුල් දවස්වල මට තිබුණු ලොකුම ප්‍රශ්නය වුණේ නියමාකාරයෙන් බංගලි භාෂාව ලියන්නට බැරි වීමයි. ඒකට විසඳුමක් වශයෙන් මට බංගලි භාෂාව ලියන්නට අපේ ආයතනයෙන් ඉගැන්නුවා. දැන් මට හොඳින් ලියන්නත් කියවන්නත් පුලුවන්.

2012 වසරේදී කණ්ඩායම් සාමාජිකාවක වශයෙන් කණ්ඩායම් නායිකාවන් සමග එක්ව පළපුරුදු සාමාජිකාවන්ගේ ද උපදෙස් මත අසීරු මැහුම් සහිත මෙහෙයුම්වලදී දවසේ ඉලක්ක සපුරාලීමට සමත් වීමි. 2014 වසරේදී කණ්ඩායම් නායිකාව වශයෙන් සාමාජික සාමාජිකාවන් 12 දෙනෙකුට නායකත්වය දෙමින් 6S ක්‍රමවේද අනුගමනය කරමින් ආයතනීය ඉලක්ක සපුරා දීමත් මගේ සාර්ථකත්වයට හේතුවකි. ඒ නිසාම 2023 වනවිට සමුහ කණ්ඩායම් නායිකාවක ලෙස නිෂ්පාදන කණ්ඩායම් හතරක 67 දෙනෙකුගේ වැඩ අධීක්ෂණය කරමින් කණ්ඩායම් හතරටම ලබා දී තිබූ ඉලක්ක සපුරාලිය හැකි වීමද විශේෂයකි. කාර්යක්ෂමතාවය වර්ධනය කර ගනිමින් 6S ක්‍රමවේද අනුගමනය කරමින් නිෂ්පාදනයේදී පැනනගින ප්‍රශ්න ගැටලු විසඳමි.

මගේ පෞද්ගලික ඉලක්කය වන්නේ Value Stream Manager (VSM) කළමනාකාරිණියක ලෙස උසස්වීමක් ලබාගැනීමයි. ඒ සඳහා දැනටමත් අවශ්‍ය සුදුසුකම් හඳුනාගෙන ඒවා සපුරාගැනීම සඳහා කටයුතු කරමි. සාමාන්‍යයෙන් විධිමත් අධ්‍යාපනයත්, ප්‍රශ්න සහ අර්බුද විසඳීමේ ක්‍රමවේදයනුත් ඉගෙනගනිමි. අමතරව, මානව සම්පත් කළමනාකරණය සහ කාල කළමනාකරණය ආදී ඉගෙනුම් ක්‍රියාවලිය සමග බැඳුණු පුහුණු වැඩසටහන්වලට සහභාගි වෙමි. ප්‍රශ්න සහ ගැටලු විසඳීමේ ක්‍රියාවලියේදී GL පෝරම් එකටත් සහභාගි වෙමි. මම MAS සමාගමෙන් ලබදෙන P.A.C.E. පුහුණුවත් GL පුහුණුවත් IE පුහුණුවත් DET ආදී පුහුණුවීම් අවසන් කර ඇත්තෙමි. ආයතනයේ දියුණුව සදහා යෝජනා සහ Kaizen ද ඉදිරිපත් කර ඇති අතර ඒවා දැනටමත් ක්‍රියාවේ යොදවා ඇත.

මම සමුහ කණ්ඩායම් නායිකාව බවට පත්වීමත් සමග සමහර කණ්ඩායම් නායිකාවන් එක එල්ලේ මගේ නායකත්වය පිළිගන්නට අකමැති වුවත් මා දැඩිව මහන්සි වී වැඩකිරීමත් කණ්ඩායම් වැඩ ගැන මට තිබෙන අවබෝධයත් පළපුරුද්දත් නිසා සමූහ කණ්ඩායම් නායිකාව වශයෙන් උසස්වීම් ලබා රැකියා ජීවිතය ජයගතිමි. මේ ගමන ඉදිරියට යාමේදී නොකඩවා ප්‍රශ්න සහ ගැටලු පැමිණුණි. ඒ සියල්ල විමසුම් නුවණින් බලා තේරුම් ගෙන මගේ ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරින්ගෙන් ද උපදෙස් ලබාගෙන 'කළ නොහැක්කක් නොමැත' යන අධිෂ්ඨානය සිතට ගෙන මනස නිරවුල් කරගෙන, පැමිණි හැම අභියෝගයකටම මුහුණ දුනිමි.

මම ආයතනයෙන් ලබාදුන් beauty culture පාඨමාලාවක් හැදෑරුවෙමි. විනෝදාංශයක් වශයෙන් ආරම්භ කළ beauty culture පුහුණුව මගේම beauty parlor එකක් පවත්වාගෙන යන අතර එය මගේ ආර්ථිකය දියුණු කිරීමටත් ශක්තියක් විය. මගේ පෞද්ගලික ඉලක්ක වන, නිවස තනාගැනීමට සහ හජ් වන්දනාවට මක්කම යාම වෙනුවෙනුත් බැංකු ගිණුමක මගේ මාසික වැටුපෙන් කොටසක් ඉතුරු කරමි. එසේම මගේ දරුවාගේ අධ්‍යාපන කටයුතු සහ අනාගත අවශ්‍යතාවන් සදහා ස්ථිර තැන්පතුවක් ආරම්භ කර මුදල් ඉතිරි කරමි.




ලීසා අක්තර්

MAS Sumantra



# මධාරා: නිවැරදි සන්නිවේදනය මගින් කාර්යක්ෂම සේවයක් ලබාදීමේ අරමුණින්

කණ්ඩායම් සාමාජිකාවක ලෙස Silueta ආයතනයට මා සම්බන්ධ වූයේ 2017 වසරේදීය. 2018 වසරේදී MAS Ayathi ආයතනයෙහි කණ්ඩායම් සාමාජිකාවක වීමි. සංවර්ධන සහකාරවරියක වශයෙන් 2019 වසරේදී උසස් වීමක් ලද මා මේ දක්වා එම තනතුරෙහි සේවය කරමි. 2024 වසර වනවිට Product Development අංශයේ විධායක නිලධාරිනියක් වීම මගේ රැකියා ඉලක්කයයි. මම මේ සඳහා අවශ්‍යවන සුදුසුකම් සපුරාලමින් සිටිමි. 2019 වසරේදී කැලණිය විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධිය ලබාගත් මා දැනට ඉංග්‍රීසි විෂයය පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරමි.

ආයතනය පවත්වනු ලැබූ නායකත්ව පුහුණු වැඩසටහන් සහ වෘත්තීය පුහුණු වැඩසටහන් මගින් ජීවිතය දිනන්නටම මඟ පෙන්වා දී ඇති බැවින් එය මගේ වෘත්තිය ජීවිතයට මෙන්ම පෞද්ගලික ජීවිතයටද පිටුවහලක් කරගතිමි. මගේම නිවසක් සාදාගැනීම මගේ ප්‍රධාන පෞද්ගලික ඉලක්කයයි. මගේ දරුවාට හොඳ අධ්‍යාපනයක් ලබාදී රටට වැඩදායී පුරවැසියකු කිරීමත් මගේ ඉලක්ක අතර වේ.
මගේ පෞද්ගලික ඊළඟ ඉලක්කය වූ මෝටර් රථයක් මිලදී ගැනීම මා දැනටම ඉටුකරගෙන ඇත. මාසික වාරික ගෙවීම මගින් එය ඉටු කර ගතිමි.

කණ්ඩායම් හැඟීමෙන් රැකියා ස්ථානයේ කටයුතු කිරීම, නිවැරදි සන්නිවේදනය, ආදර්ශමත් බව, කාර්යක්ෂමව සේවය කිරීම මගේ ගුණාංග අතර වේ.
ආයතනය මගින් පවත්වන ලද වෙසක් බැති ගී සරණිය, කැරොල් ගී, හා නත්තල් සැරසිලි ආදියට දායක වෙමින් ආයතනයේ පිරිත් පින්කමෙහි පෙරහැර කටයුතු සංවිධානයටද සහයෝගය දැක්වීමි. අවුරුදු උත්සවවලදී ක්‍රීඩා තරඟ සඳහා ද සහභාගි වන අතර CSR ව්‍යාපෘති සඳහා ද සහභාගි වීමට අමතක නොකළෙමි.

හොඳ සන්නිවේදකයකු මෙන්ම හොඳ ඇහුම්කන්දෙන්නෙකු වීම මගින් සහයෝගීතාව හා සහසම්බන්ධතාව වැඩි දියුණු කර ගතිමි. පවුලට මෙන්ම ආයතනික පරිසරයටද, මුළු මහත් සමාජයටද වැඩදායී ධනාත්මක ආකල්ප දරමින් සේවය කරමි. වසරේ සවිබල ගැන්වූ කාන්තාව ලෙස තේරී පත් වුවහොත් ආයතනයට වටිනාකමක් එක් කළ තවත් එක් සාමාජිකාවක ලෙස මා නිහතමානීව ආඩම්බර වෙමි.

කණ්ඩායමේ සාමාජිකයින් සමග සහයෝගිතාවය හා සම්බන්ධතාව මනාව රැකගනිමින් තෘප්තිමත් ලෙස රැකියාව කිරීමට මට හැකිවී තිබේ. සුභවාදී අදහස් දරන්නවුන් ඇසුරු කරමින් ඔවුන් සමග ඵලදායී සබඳතා ගොඩනගා ගනිමින් අනෙකාටද ශක්තියක් වෙමින් මාගේ ජීවිතය ගොඩගනා ගැනීමට මහත් හැකියාව ලැබී ඇත. කණ්ඩායම් හැඟීමෙන් ක්‍රියා කරමින්, මධ්‍යස්ථව සිතීමෙන්, නිවැරදි සන්නිවේදන ක්‍රම භාවිතයෙන් ඉලක්ක හඹායාමටත්, කාර්යක්ෂමව ආදර්ශමත්ව මගේ රැකියාව කිරීමටත් මට Silueta ආයතනයෙන් ලැබූ සහයෝගයට සහ රැකවරණයට මම කෘතඥ වෙමි.




**මධාරා නවරත්න**

MAS Intimates - Ayathi



# මේනකා: හැමවිටම රැකියාවට මුල් තැන දී

වැඩිදුර අධ්‍යාපනය ලැබීමට අවස්ථාවක් හිමි නොවූ බැවින් මම පානදුර යුනිචෙලා ආයතනයෙහි කණ්ඩායම් සාමාජිකාවක ලෙස 2012 වසරේදී රැකියාවට බැඳුණෙමි. නිවැරදි ඇඟළුමක් නියමිත වේලාවට නියමිත තත්වයෙන් නිෂ්පාදනය කිරීම මගේ කාර්යය විය. 2014 වසරේදී Skill Master කෙනෙකු ලෙස ඇඟලුමේ සියලුම Operations මැසීමට හැකියාව මට ලැබුණි.

2016 වන විට කණ්ඩායම් නායිකාවක වූ මම එම කණ්ඩායම නිවැරදි ලෙස හසුරුවා ගැනීමට සමත් වීමි. 2019 වසරේදී සමූහ කණ්ඩායම් නායිකාවක වූ මට කණ්ඩායම් කිහිපයක් හසුරුවා ගනිමින් නියමිත නිෂ්පාදන ඉලක්ක සපුරා ගැනීමට හැකියාව ලැබිණි විධායක නිලධාරිනියක වීම මගේ රැකියා ඉලක්කයයි. එම සිහිනය සැබෑ කරගැනීමට අවශ්‍ය සියලු සුදුසුකම් මා මේ වන විට සපුරාලමින් සිටිමි. P.A.C.E. වැඩසටහනටද, ශිල්ප යාත්‍රා වැඩ සටහනටද, Team Leader / Group Leader පුහුණු වැඩසටහන් සඳහාද, SLITA ආයතනයේ Pattern Making Diploma පාඨමාලාව සඳහාද මම සහභාගි වූ අතර එමගින් විශාල දැනුම් සම්භාරයක් ලබාගත හැකිවිය.

ශිල්ප යාත්‍රා වැඩ සටහන හරහා සම්පූර්ණයෙන් Bra ඇඟලුමක් නිෂ්පාදනය කරන ආකාරයත් එයට අවශ්‍ය අමුද්‍රව්‍ය පිළිබඳව දැනුමත් ලබාගන්නා අතර විශ්වවිද්‍යාල පුහුණුවක්ද ලබාගැනීමට හැකිවීම මගේ භාග්‍යයකැයි මට හැඟේමි. එසේම එම පුහුණුවීම් මගේ පෞද්ගලික ජීවිතයටද යොදාගෙන කටයුතු කරමි. එය මගේ දියුණුවට මහත් සේ රුකුලක් විය.

P.A.C.E. වැඩසටහන හරහා අන්‍යයන් සමඟ ගනුදෙනු කරන ආකාරයත්, සන්නිවේදනය කරන ආකාරයත්, මූල්‍ය කළමණාකරණය පිළිබඳව දැනුමත් ලබාගත හැකි විය. මගේ රැකියාවට පමණක් නොව පෞද්ගලික ජීවිතයට එම දැනුම මහත් පිටිවහලක් විය.

මගේම කියා පෞද්ගලික ව්‍යාපාරයක් ආරම්භ කිරීම මගේ ලොකු හීනයක් සැබෑවීමක් විය. දැන් එය ඉතා සාර්ථකය.

මගේම ව්‍යාපාරයක් ආරම්භ කළ අතර එමගින් සාම්පල් මැසීමත් ඇණවුම් ලබාගැනීමත් කළ හැකි විය. මේ මගින් අමතර ආදායමක් ලබාගැනීමත් මට හැකි විය. තවද එම ව්‍යාපාරය තුළ සමහර අංශ සඳහා මැෂිමක් හිමි කාන්තාවන් සම්බන්ධ කරගැනීමටද මට හැකි විය. මේ මගින් බාහිර ප්‍රජාවටද සේවයක් කිරීමට හැකියාව මට උදාවිය. කාන්තාවන් ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීමට හැකිවීම මට මහත් සතුටකි.

රැකියා ස්ථානයේ Mother Module අභියෝගයට සාර්ථකව මුහුණ දීමට මට හැකියාව ලැබුණි කෑලි ගණන වැඩි කිරීම, 3 pcs පාලනය කිරීම, කණ්ඩායම තුළ 100% - 130% දක්වා කාර්යක්ෂමතාවයක් ළඟා කරගැනීමටද මට හැකියාව ලැබිණි. ධනාත්මක චින්තනය භාවිතය මගින් පිරිස හසුරුවා ගනිමින් ඔවුන්ගේ මෙන්ම ඉහළ කළමනාකාරිත්වයේ උපකාර සහ මගපෙන්වීම සහිතව කණ්ඩායම අංක 1 සේවා මුර දෙකකින්ම දිරි දීමනා වශයෙන් රුපියල් 10500ක මුදලක් ලබාගැනීමට පළමු මාසය තුළම හැකිවිය.

මා මේ වන විට මගේ පවුල තුළද රැකියා ස්ථානයේද, ප්‍රජාව අතරද කැපී පෙනෙන චරිතයක් බවට පත්වී හමාරය. මෙම පන්නරය ලබාදුන් මගේ රැකියා ස්ථානය වන MAS Intimates Unichela Panadura ආයතනයට මම තුති පුදමි.




**මේනකා විජේසේකර**

MAS Intimates - Unichela Panadura



# නහිදා: විනෝදයට කවි ලියමින්

නව යොවුන් වියේදීම මගේ ඉගෙනුම් කටයුතු නතර කරන්න වුණේ මුදල් අගහිඟතා නිසා. මගේ අනාගත සිහින බලාපොරොත්තු සියල්ලම හිතින් අත්හැරියා. නමුත් ජීවිතය කෙසේ හෝ ජීවත් කරවිය යුතු නිසා තීරණය කළා කුමන හෝ රැකියාවකට යනවා කියලා. ඒ නිසා රැකියාවක් සොයා MAS Intimates කර්මාන්තශාලාවට පැමිණියේ 2020 වසරේදී. මම එම ආයතනයට බැඳෙන්නෙ ලොකු බලාපොරොත්තු ඇතිව නෙමෙයි. එදින මාව එහි නිෂ්පාදන කණ්ඩායම් සාමාජිකාවක ලෙස බඳවාගන්නවා. මං කවදාවත් හිතුවෙ නැහැ එතැන මගේ නිවහන වෙයි කියලා. කණ්ඩායමේ තව පහළොස්දෙනෙක් හිටියා. අපට පැවරිලා තිබුණේ ඇඟලුම් මහන්න. ඒ විතරක් නෙමෙයි එතැන වැඩ හරිම පිළිවෙළයි. ඒනිසා ආරක්ෂණ විධි පහක් කියලා දුන්නා ඒකට අනුගත වෙන්න සිදුවුණා. 5S කියලා හැඳින්නුව කාරණා පහම මට මගේ ජීවිතේ හදාගන්නත් වටිනව කියල මට හිතුණා. තව තව වටිනා කරුණු කාරණා රැසක් එතැනදී ඉගෙනගන්න ලැබුණා. එහෙම කාලය ගතවෙලා 2022 වසරේ මට උසස්වීමක් ලැබුණා කණ්ඩායම් නායිකාවක විදියට. එතැනදී නම් වැඩ වැඩිවුනා. ඒත් ඒ වැඩ මට වැදගත් වුනා මගේ දියුණුවට. කණ්ඩායමට නායකත්වය දෙමින් ඉලක්ක සපුරාලීම ප්‍රධානයි. ඊට අමතරව කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම, සමාජිකාවන් නොකඩවා සේවයට කැඳවා ගැනීම, නිෂ්පාදන පේළිවල සාමාජිකාවන්ගේ ක්‍රියාකාරකම් සොයා බැලීම යනාදී වශයෙන් අනෙක් වගකීම් පෙළ ගැහිලා තිබුණා. ඒ වගේම ඒ වෙනකොට මගේ දැනුම පළපුරුද්ද සමගම ආදායම් තත්ත්වයද වර්ධනය වෙලා තිබුණා.

මම ආපසු හැරී බැලුවේ මගේ අධ්‍යාපන කටයුතු අඩාල වූ තැනින් ඉදිරියට යන්නෙ කොහොමද කියලා. දැන් මට ඉගෙනගැනීමට වියදම් කිරීමට මුදල් තියෙනවා. ඒ නිසා නැවතත් පාසල් යා යුතුයි කියලා හිතලා චිතගොං රාජකීය විද්‍යාලයට ඇතුළත් වෙලා රැකියාවට යන එන ගමන්ම ඉගෙනගැනීමත් කරමින් 2026 වන විට ඉතා සාර්ථක අයුරින් BA ගෞරව උපාධිය ලබාගන්න උත්සාහ කරනවා. මගේ රැකියා ජීවිතයේ ඉහළම බලාපොරොත්තුව 2028 වසර වන විට MAS Sumantra කර්මාන්තශාලාවේ නිෂ්පාදන කළමනාකාරියක ලෙස උසස් තනතුරක් ලබාගැනීමයි. ඒ සඳහා අවශ්‍ය දැනුම සහ පුහුණුව දැන් සිටම ලබමින් සිටිනවා. මානව සම්පත් කළමනාකරණය සහ තාක්ෂණික දැනුම ලබාගැනීම, අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ගැනීම, ආත්ම විශ්වාසය තහවුරු කර ගැනීම යනාදිය ඉටුකර ගන්නේ ඒ උදාර බලාපොරොත්තුව නිසයි. ඒ අතර වඩාත් වැදගත් වන්නේ MOS ක්‍රියාවලිය හඳුනාගැනීමයි. ඒවාට අනුගතවීම ජීවිතයට වඩාත් වැදගත් වටිනාකමක් ලෙසයි මම හිතන්නෙ. මේ සියලුම දේ සමග ව්‍යවසායිකාවක වීමත් අරමුණු කරගෙන සාමාන්‍ය මහන මැෂිමක් මිලට ගත්තේ ඇඳුම් මැසීමට සම්බන්ධ මැහුම් ආයතනයක් ආරම්භ කරන්න බලාපොරොත්තුව ඇතිවයි. කුමක් කළත් දැනුමක් ඇතිව කළ යුතු නිසා මැහුම් පංතියකට ගිහින් මාස තුනක පාඨමාලාවක් හැදෑරුවා. ඒ නිසා මුලින්ම ටේලර් සාප්පුවක් ආරම්භ කරලා ගමේ කීපදෙනෙකුට රැකියා අවස්ථාවන් ලබාදෙන්නත් පුලුවන්.

විනෝදයට කවි, කථා ලියන අතර සමාජයට ආදර්ශමත් විශේෂාංග සහිත ලිපි ද ලියා සමාජ මාධ්‍ය වල පළකරන්නේ ඉන් වින්දනයක් ලබාගැනීමටයි.




**නහිදා සුල්තානා**

MAS Sumantra



# නයනා: අමාරුම වැඩ පහසුවෙන් කිරීම

ඕනෑම අමාරු ඇඟලුම් ස්ටයිල් එකක් ඉතා ඉක්මනින් අධ්‍යයනය කර එය ඉතාපහසු ආකාරයෙන් ලයින් එකට ෆීඩ් කර තම කණ්ඩායමට එය හුරු කිරීම නයනාගේ දක්ෂතාවයකි. ඒ නිසාම ඇය තම කණ්ඩායමේ නායකත්වය උසුලමින් සහෝදර සේවිකාවන් අතර ද ජනප්‍රියත්වයට පත්ව ඇත. ඇය එම ප්‍රවීණත්වය ලබාගනු ලැබුවේ එක් රැයකින් නොව විවිධ අංශවල විවිධාකාර පුහුණුවීම් සහ ප්‍රායෝගිකව ඒවා අත්හදා බැලීම් තුළිනි.

2008 වසරේ Bodyline සමාගමට සම්බන්ධ වන නයනා තම මූලික පුහුණුව ලෙස මැෂින් වර්ග සහ ඒ ඒ මැෂිමට අදාල තාක්ෂණික වෙනස් කම් හැදෑරූ අතර ඒ මැෂින් ක්‍රියාකරවන්නත් පුහුණු වූවාය. ඒ නිසාම ඇගේ මැෂිමේ මැහෙන ඇඟලුම් තත්වයෙන් උසස් ලෙස නිමාවූ අතර දවසේ නිෂ්පාදන ඉලක්ක සපුරාලීමටද සමත්විය. මේ කාරණය නිසාම නයනා 2010 වසරේදී ජම්පර් (Jumper) ශ්‍රේණියට උසස්වීමක් ලැබුවාය. Critical Operation වලටම දක්ෂතා දැක්වූ නයනා ආයතනික කළමනාකාරීත්වය විසින් ජම්පර් (Jumper) තනතුරට පත්කර එම කණ්ඩායමේ සෙසු සාමාජිකාවන්ටත් එම කාර්ය පුහුණු කිරීමේ වගකීම ද ඇයට පැවරුවාය.

ඉන්පසුව 2017 නයනා TL තනතුරට උසස්වීම ද ලැබුවාය. නයනා තම හැකියාවන් දියුණුකර ගැනීම සඳහා දැඩි ලෙස මහන්සිවූ කාන්තාවකි. ඇය TL/GL පුහුණු පාඨමාලව හැදෑරීම අතරතුර තාක්ෂණික අවශ්‍යතා සමග ප්‍රායෝගිකව ඒවායේ නිරත විය. එපමණකින් සෑහීමට පත් නොවූ ඇය තත්වපාලනය පිළිබඳව පාඨමාලාවක් හැදෑරීය. මේ සියලු පුහුණුවීම් නිසා ඇය style leader ලෙස අවුරුද්දක් තම කණ්ඩායම මෙහෙයවීය.

නයනා කුඩා කල සිට සුව පහසු ජීවිතයක් ගත කළ තැනැත්තියක නොවූවාය. ඇගේ ළමා කාලය ගතවන්නේ කඳුගැටයක පිහිටි කුඩා නිවසකය. එම නිවසට පානීය ජලය සපයා ගැනීමට කිලෝ මීටරයක තරම් දුරක් කඳු පාමුලට යා යුතුය. එවන් පරිසරයක කර්කෂ ජීවිතයකට හුරුව සිටියදීත් කුප්පි ලාම්පු එළියෙන් පාඩම් කළ නයනා අ.පො.ස සාමාන්‍ය පෙළ සහ අ.පො.ස උසස් පෙළ විශිෂ්ට ලෙස සමත් වූවාය. ඇය තම ජීවිතයේ යම් සැනසුම් සුසුමක් හෙලුවා නම් ඒ Bodyline ආයතනයට සම්බන්ධ වූවායින් පසුව බව ප්‍රශංසනාත්මකව ප්‍රකාශ කර සිටි. Bodyline ආයතනයට සම්බන්ධ වී අවුරුදු 15 ක් ගතවන මේ කාලයේ ඇය තම අත්දැකීම් සහ ජයග්‍රහණ තුළින් ජීවිතය සාර්ථක කරගත් ගෘහණියකි.

එඩිතර කාන්තාවක ලෙස නිතරම බාධක කම්කටොලුවලට මුහුණ දී පුරුදුව සිටි නිසා ජීවත්වීම වගකීමක් ලෙස ගෙන රැකියාව දේවකාරිය සේ සලකා කටයුතු කළාය. අද වන විට තමන් විසින් තනාගත් නිවසක පදිංචි වී තම මෝටර් රථයෙන් ගමන් බිමන් යමින් තම දෙමාපියන් දෙපළද රැකබලා ගනිමින් ඔවුනගේ බේත් හේත් ආහාර පාන ආදියද නොඅඩුව සලසා දෙමින් සැනසිලිදායක දිවියක් ගතකරන්නීය.




**නයනා විලේගොඩ ලියනගේ**

Bodyline - Horana



# නිෂාරා: නව අත්හදා බැලීම් තුලින් සාර්ථකත්වයට

MAS Matrix ආයතනයෙහි පොත්පත් සහ ලිපිද්‍රව්‍ය සඳහා වසරකට වැය වන මුදල අවම කරමින් Kaizen ඉදිරිපත් කළ ඇය 2016 වසරේදී MAS Matrix ආයතනයට සම්බන්ධ වන්නේ Skill Matrix Assistant වරියක වශයෙනි. සම්මත කරගත් නිර්ණායකයන්ට අනුකූලව කණ්ඩායම් සාමාජිකයන්ගේ නිපුණතාවය මැන බැලීම සහ ඊට අදාළ දීමනා ගණනය කිරීම එහි කාර්යය භාරය විය. 2021 වසරේදී Shift ER තනතුරෙහි සියලු සාමාජිකයින් හට කායිකව හා මානසිකව සතුටින් සේවයෙහි නියැලිය හැකි වැඩ පරිසරයක් සකසමින් නිෂ්පාදන ඵලදායීතාවය වැඩිකරගැනීමට ඇය දායක වූවාය. 2022 වසර වනවිට Time and Attendance user තනතුරට පත්වූ ඇය මාණ්ඩලික ශ්‍රේණියේ සිට කණ්ඩායම් සාමාජිකයින් දක්වා ආයතනයට පැමිණීමේ සිට පිටවීම දක්වා ඇති ගැටළු විසඳමින් වැටුප් සම්බන්ධ ගැටලු නිරාකරණය කරමින් සෑම මසකම පළමු වැඩ දින Legato Payroll අංශය වෙත භාරදීමට කටයුතු කළාය .

2023 වන විට විධායක ශ්‍රේණියේ තනතුරක් වෙත උසස්වීම ඇයගේ ඉලක්කයයි. ඒ සඳහා පසුබිම සකසමින් සිටින ඇය දැනට ආරම්භ කර ඇති Post Graduate Diploma පාඨමාලාව අවසන් කිරීමට බලාපොරොත්තු වන්නීය. ඉංග්‍රීසි භාෂාව භාවිතය පිළිබඳව දැනුම වර්ධනය කරගැනීම සඳහා Master English Language පාඨමාලාව හදාරන අතර එය සාර්ථකව අවසන් කිරීමට ඇය අපේක්ෂා කරන්නීය. උසස් වීම් සඳහා අවශ්‍ය skills කෙරෙහි වැඩිපුර උනන්දුවන ඇය අන්තර්ජාලය භාවිත කරමින් අමතර දැනුම ලබාගන්නීය. තවද MAS ආයතනය මගින් ලබා දෙන විවිධ පුහුණු වැඩසටහන් වලටද ඇය සහභාගි වී ඇත.

ඇයගේ නව නිවසේ වැඩකටයුතු අවසන් කර ගැනීමට ද ඇය අපේක්ෂා කරන්නීය. දියණියන් දෙදෙනාට මනා අධ්‍යාපනයක් ලබාදීම ඇගේ අරමුණකි. මේ හැරුණු විට ඇගේ ව්‍යාපාරය කටයුතු හොඳින් පවත්වා ගැනීමට සහ වෙළඳපොළ පුළුල් කර ගැනීමට ද ඇය අදහස් කරයි.

නව ක්‍රම සහ උපාය මාර්ග කෙරෙහි යොමුවන ඇය ඇඟිලි සටහන් භාවිතය සඳහා තිබූ Winpole 01 පද්ධතිය වෙනුවට නව Winpole කෙරෙහි යොමු වීම තුලින් ඇඟිලි සටහන් සම්බන්ධ තිබූ ගැටලු නිරාකරණය කරගත හැකි විය. ආයතනයේ මරණාධාර අරමුදලද සාර්ථක ව පවත්වා ගෙන යමින් නව ක්‍රමවේදයක් ඔස්සේ සාමාජික සාමාජිකාවන් හට රක්ෂණ සමාගම් මගින් විශ්වාසනීය සේවයක් ලබාදීමට හැකියාව උදාකර ඇත. ඉවසීමෙන් සහ මනා සංයමයකින් කටයුතු කරන ඇය සැමියා ගේ වියෝවෙන් පසුව පවුලේ සියලු වගකීම් භාරගෙන දිරිය මාතාවක ලෙද කටයුතු කරන්නීය.

ඇය 2022 වසරේදී අභිමානී තරඟාවලියේදී ව්‍යවසායකත්ව අංශයෙන් තෙවන ස්ථානය දිනා ගත්තාය. ආයතනය මගින් පැවැත්වූ වොලිබෝල් තරඟ සඳහා ද සහභාගි වී ජයග්‍රහණය ලබා සිටින ඇය භක්ති ගී කණ්ඩායමේද සාමාජිකාවකි. ආයතනයෙන් බැහැරව සමාජය තුළදීද ඇය නොයෙකුත් වැඩසටහන්වලට සහභාගි වන්නීය. කාන්තාවන් දිරිමත් කරමින් ඇය ප්‍රජාවටද සේවයක් කරන්නීය.




**නිෂාරා මධුෂානි සුබසිංහ**

MAS Matrix



# කුමාරි: අභියෝග ඉතා කැමැත්තෙන් බාරගනී

අපේ ආයතනයේ කණ්ඩායම් නායක නායිකාවන් සහ සමූහ කණ්ඩායම් නායක නායිකාවන් පිළිබඳව සංකල්පය හඳුන්වා දෙන මුල් අවධියේ කිසිම සාමාජිකයකු හෝ සාමාජිකාවක ඊට කැමති වූයේ නැත. එම කටයුත්ත විශාල බරක් ලෙස සිතූ බොහෝ දෙනා පසුබසින මොහොතක ඒ අභියෝගය බාරගන්නට නිර්භයව මම ඉදිරිපත් වූයෙමි. එසේම ඒ වගකීම් සියල්ල නිසි පරිදි ඉටුකරමින් නිෂ්පාදන ක්‍රියාවලිය සාර්ථකව පවත්වාගෙන යාම සඳහා මගේ උපරිම සහයෝගය ලබාදුනිමි. එතැනින් නොනැවතුන මා තව තවත් කණ්ඩායම් නායක නායිකාවන් බිහි කිරීමට සහයෝගය ලබාදී එම තනතුර සඳහා පැවැති බිය හා කුතුහලය ඉවත්වන ආකාරයට වැඩ කටයුතු ඉටුකළෙමි.

මම කොග්ගල යුනිචෙලා ආයතනයට සේවය සඳහා සම්බන්ධ වන්නේ 2007 වසරේදීය. ඒ කණ්ඩායම් සාමාජිකාවක වශයෙනි. එහිදී කණ්ඩායමට එදිනෙදා ලැබෙන ඇඟලුම් නිෂ්පාදනයන් ආයතනය බලාපොරොත්තුව වන සංඛ්‍යාව ලබාදීම කණ්ඩායමේ වගකීමක් විය. ඒ සඳහා සියලු දෙනා සමග එක්ව එම කාර්ය සඵල කර ගැනීමට සහාය විය. 2009 වසර වනවිට කණ්ඩායමකට නායකත්වය දීමට අවස්ථාව උදාවිය. 2017 වසරේ කණ්ඩායම් පහකට නායකත්වය ලබාදෙමින් ආයතනයේ ඉලක්කයන් සපුරාදීමට හැකියාව ලැබුණි. එය මගේ ආර්ථික තත්වයට විශාල බලපෑමක් කළ අතර මගේ ජීවන ගමනද සාර්ථක කරගැනීමට හැකි විය. එසේම 2025 වසර සැලසුම් කර ඇත්තේ නිෂ්පාදන අංශයේ විධායක නිලධාරිනියක වීමටයි. අවශ්‍ය සුදුසුකම් සපුරා ගැනීම සඳහා විවෘත විශ්වවිද්‍යාලයෙන් ඉංග්‍රීසි භාෂාව සහ ව්‍යාපාර කළමනාකරණ උපාධි පාඨමාලා හැදෑරීමට සූදානම් වෙමි. ආයතනයෙන් මේ තාක් ලැබුණු පුහුණුවීම් වන MOS පුහුණුව, ශිල්ප යාත්‍රා පුහුණුව, Work Study පුහුණුව යනාදියෙන් ලත් දැනුමත් භාවිතා කරමි. මගේ පෞද්ගලික ජීවිතයේ ලොකුම බලාපොරොත්තුව දියණියගේ උසස් අධ්‍යාපන කටයුතුවලට උපරිමයෙන් සහාය ලබාදී වෛද්‍යවරියක වීමේ සිහිනය සැබෑකර දීමයි. ඒ සඳහා අවශ්‍ය සෑම පහසුකමක්ම සලසා දී ඇත. සමාජ සත්කාර්යයක් ලෙස සලකා මව්පිය දෙපල අහිමි දරුවෙකුට හොඳින් ඉගෙනගැනීමට අවශ්‍ය සියලු පහසුකම් සපයා දී ඇත.

රැකියාවට අමතරව පෞද්ගලික ව්‍යාපාරයක් ලෙස තේ පැළ තවානක් සකස් කර ඇත. මේ කාලයේ අලුතින් තේ වගාකරන අයට තේ පැලයක් රුපියල් තිස්පහක් වැනි මුදලට අලෙවි කළ හැක. අක්කරයක ඉඩමක් මිලට ගෙන එක පැත්තක තවානද ඉතිරි ප්‍රදේශයේ තේ වගාවක් කර ඇත. එහි දළු කැඩීමට ගමේ කාන්තාවන් තිදෙනෙකුට රැකියා සපයා ඇත. ඉන් එක් කාන්තාවක් අසනීපයෙන් පෙළුණත් අනෙක් දෙදෙනාටම සමාන වැටුප් ඇයටත් ගෙවන්නේ සමාජ යුතුකමක් සේ සිතාගෙනය. ගමේ පවතින ශ්‍රමදාන කටයුතු වලට නිතරම සහාය දෙන අතර පන්සලේ පවතින පිංකම් කටයුතුවලටත් නොමසුරු සහයෝගය ලබාදෙමින් පවුලේ එදිනෙදා කටයුතු ද නොපිරිහෙලා ඉටුකරමි.




**කේ. එම්. එන්. පී. කුමාරි**

MAS Intimates - Unichela Koggala



# පියුමි: තමන් සතු ශක්තීන් විශ්වාස කරන්න...

පියුමි නිසංසලා තම රැකියාව පිළිබඳව මනා අවබෝධයකින් සහ රැකියාවේ විෂය පථයට අදාළ භූමිකාව තේරුම් ගෙන වගකීම උපරිමයෙන් ඉටුකරන්නියකි. ඇය කණ්ඩායම් සාමාජිකාවක ලෙස සේවයට බැඳී Fabric Inspection අංශයේ Fabric Checker කෙනෙකු වශයෙන් සේවය කළේ ඉතා උවමනාවෙන් සහ ආශාවෙනි. ඒ කාලය තුළ එම අංශයේ සියලු රාජකාරි කටයුතු පිළිබදව මනා අවබෝධයක් ලබාගත් අතර එහිදී ඇය විසින්ම හඳුනාගත් පුහුණු අවස්ථා සම්පූර්ණ කර ගැනීමටද උත්සාහ කළාය. එබැවින් SLITA ආයතනයෙන් DYU සහ Finishing පිළිබඳව පාඨමාලා හැදෑරීය. ඊට අමතරව Operation skill, Technical skill යනාදිය දියුණු කරගත්තාය. MOS Culture එක තමා තුළ ගොඩනගාගත්තාය. ඒ නිසාම MOS අංශය මෙහෙයවන යාත්‍රා සහ JFB වැඩසටහන් සම්පූර්ණ කළ පියුමි ඇගේ සන්නිවේදන හැකියාවන් දියුණු කර ගැනීම සඳහා Esoft Metro Campus හි Leadership & Management පාඨමාලා හදාරමින් සිටී. ඇය 2022 වසරේ කැලණිය විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි අපේක්ෂිකාවක ලෙස ලියාපදිංචි වී ව්‍යාපාර කළමනාකරණය පිළිබඳව අධ්‍යයන කටයුතු කරගෙන යන්නීය. තවද, IMBS Green Campus හි Diploma in Business Management (Certificate Level) අධ්‍යයන කටයුතු කරගෙන යාමත්, Leadership knowledge වර්ධනය කර ගැනීම සඳහා On the job Training සහ You-tube Channel follow කිරීමත් කරයි. මේ නිසාම Fabric Inspection අංශයේම කණ්ඩායම් නායිකාව බවට පත්වීමට පියුමිට වැඩි කාලයක් ගත නොවුණි. එසේම Fabric Inspection අංශයේම සාමාන්‍ය සේවා මුරයේ කණ්ඩායමට නායකත්වය දෙමින් එය මෙහෙයවීමේ අවස්ථාව ඇයට උදාවුණි. ඉන්පසුව ඇය Operation Department එකෙහි Goods Delivery මෙහෙයවීමට යොදවන ලදී.

ඇය 2020 වසරේදී එම අංශයේම කණ්ඩායම් නායිකාව බවට පත්විය. එහිදී Fabric inspection අංශයේම සාමාන්‍ය සේවා මුරයේ කණ්ඩායමට නායකත්වය දුන්නීය. දැන් ඇය උත්සාහ කරන්නේ ඇගේ ඊළඟ ඉලක්කය වන විධායක නිලධාරිනියක වීමේ බලාපොරොත්තුව ඉටු කර ගැනීමටය. ඒ අනුව ඇය Operation skill, Technical skill, Communication skill, Leadership skill,Management skill යනාදිය වැඩිදියුණු කරගෙන යන්නීය. 2022 වසරේදී Future Star වැඩසටහනට ඉදිරිපත්වී එහි දෙවන ස්ථානය ලබාගෙන ඇත. 2023 වසරේ යාත්‍රා 4 වන කණ්ඩායමට සම්බන්ධ වී Batch Top විය. NCQP තරඟාවලියෙන් රන් පදක්කම දිනා ඇත. General English වැඩසටහනටද, ව්‍යාපාර කළමනාකාර පුහුණු වැඩසටහනටද සම්බන්ධවී ලබාගත් අත්දැකීම් ආයතනික පෞද්ගලික කටයුතුවලදීත් ඉතා ප්‍රයෝජනවත් වී ඇත.

පියුමි ව්‍යවසායිකාවක ලෙස කාබනික පොහොර යොදා අන්නාසි සහ මඤ්ඤොක්කා අක්කර කීපයක වගා කර ඇත. එසේම Blossom Heart Earring යන ඇගේ ව්‍යාපාරය වැඩි දියුණු කරන්නත් සූදානම් වන්නීය. නිවසෙහි ඉදිකිරීම් කඩිනමින් නිම කිරීමත්, වාහනයක් මිලට ගැනීමත් ඇගේ අනාගත ඉලක්ක වේ.




**පියුමි නිසංසලා**

MAS Fabrics Intimo



# රාජේස්වරී: පරිගණක තාක්ෂණවේදිනියක වීමේ සිහිනයක්

පිරිමි දරුවෙකුත් ගැහැනු දරුවොම පස් දෙනෙකුත් සිටිය පවුලේ පස්වැනි ගැහැනු දරුවා මමයි. මගේ තාත්තා තරුණ කාලෙදිම එයාගේ දෙමව්පියන්ගෙන් වෙන් වෙලයි හැදිල තියෙන්නෙ. අපිට උදව්කරන්න ඥාතීන් කවුරුවත් හිටියෙ නැහැ. ඒ නිසා මට උසස් ද්විතියික පංතියෙන් අධ්‍යාපන කටයුතු නතර කරන්නට සිදුවුණා. ඊට පස්සේ අපට සිදුවුණා රැකියාවල් සොයන්න. ඒ අවස්ථාවේ මගේ සහෝදරියෝ දෙදෙනෙක් මේ කර්මාන්ත ශාලාවට සම්බන්ධ වුණා. මම පමණක් උසස් අධ්‍යාපන කටයුතු සඳහා සූදානම් වෙමින් සිටියත් තාත්තාගේ අසනීප තත්ත්වයත් සමග මගේ උසස් අධ්‍යාපන සිහිනය ද ආශාවන් ද අනාගත අපේක්ෂාවන් ද බොඳ වී ගියා. ඒ නිසා මමත් මේ ආයතනයටම සම්බන්ධ වීමට තීරණය කළා. මුලින්ම මමත් නිෂ්පාදන කණ්ඩායම් සාමාජිකාවක ලෙස සේවයට පැමිණා, මැහුම් කටයුතු කළා. ඒ 2010 වසරේදී. 2013 වසර වෙනකොට තත්ව පාලන සුපරීක්ෂිකාවක ලෙස උසස්වීමක්ද ලැබුණා.

ඒ අතරතුර මම දුරස්ථ අධ්‍යාපන ක්‍රමය යටතේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳව උපාධිය (BBA) සමත් වුණා එසේම මම ලබන වැටුපෙන් මුදල් ප්‍රමාණයක් ඉතිරි කරගෙන MCA (Master of Computer Application) විභාගය සඳහා සූදානම් වුණේ මාස්ටර් උපාධිය සමග හොඳ වැටුප් තලයකට යාමට සිතාගෙනයි. නමුත් ඒ සිහිනය සුණුවිසුණු වී ගියේ, කොවිඩ්වලට කාලයක් මෙම ආයතනයත් රටත් වසා තිබුණු නිසා.

හොඳ කණ්ඩායම් සාමාජිකාවක් නම් ඇගේ කණ්ඩායමේ සෙසු අය සමග සුහදත්වය, විශ්වාසය ඇතිවන ආකාරයට සහයෝගයෙන් වැඩ කළොත් පමණයි සාර්ථකව දිරි දීමනා ලබාගැනීමට සුදුසු වෙන්නේ. එසේම මගේ කණ්ඩායමට නවක සාමාජිකාවක පැමිණියහොත් ඇය සමග සාකච්ඡා කොට ඇයට පහදා දෙනවා ඇයත් දැන් මෙම කණ්ඩායමේම සාමාජිකාවක් නිසා එකම සිතින් අප හා එක්ව වැඩකර දියුණු වෙමු කියලා. මම කොහොම හරි ජීවන මගේ අරගල කරලා අමාරුවෙන් මහන්සියෙන් වැඩ කරලා මගේ දියුණුව සාදා ගත්තා. මට ලැබෙන ඉතාම සුලු අවස්ථාවක් පවා ප්‍රයෝජන ගෙන අනාගතය සාර්ථක කරගන්නයි මගේ බලාපොරොත්තුව.

මම MAS Intimates Fashions India 2 කර්මාන්තශාලාවේ වැඩට පැමිණි දා පටන්ම එහි කළමනාකාරිත්වය ඉතා දයානුකම්පාවෙන් යුතුව මට සැලකුවා, සහාය දුන්නා, නිදහස දුන්නා, මගේ අනාගතය දියුණු කරගන්න කියලා. ඒ සඳහා නියම තනතුරක පිහිටුවා අධ්‍යාපන කටයුතු දියුණු කර ගැනීමට උදව් කළා. ඒ අනුව 2021 දී MAS Intimates Fashions India 2 කර්මාන්තශාලාවේ සහකාර තත්වපාලිකාවරියක ලෙස පත්කරනු ලැබුවා. එහෙයින් මං අදත් ගෞරවනීය ලෙස සිහිපත් කරනවා 2010 වසරේ දී මම මේ ආයතනයට සම්බන්ධ වූ නිසා තමයි මගේ සිහින සහ අපේක්ෂාවන් මල්ඵල ගැන්වුණේ කියලා.

ගමේ ළමයින්ට ටියුෂන් දීලා උගන්වනවා දුප්පත්කමෙන් අත් මිදෙන්නේ කොහොමද කියල. ඒ මගේ සමාජ සේවයයි.




**රාජේස්වරී කේ.**

Intimate Fashions India Private Limited 2



# රසිකා: හැකියාවෙන් සන්නද්ධ කණ්ඩායමක් බිහිකිරීම අරමුණයි

2009 අප්‍රේල් 27 මගේ ජීවිතයේ වටිනාම දවසකි. ඒ මම Asialine කර්මාන්තශාලාවට බැඳුණු දවසයි. මම නුපුහුණු කණ්ඩායම් සාමාජිකාවක ලෙස නිෂ්පාදන අංශයට සම්බන්ධ වුණෙමි.

වැඩ පහසුවෙන් කිරීමට ඉගෙනගැනීම මගේ සාමාන්‍ය පුරුද්දකි. ඒ නිසා පුහුණු කාලය ඉතාමත් ආශාවෙන් නිම කළෙමි. 2010 දී නිෂ්පාදන පේළියක ස්ථිර ස්ථානයක් ලැබුණි. ඇඟලුමක් මසා එය නිසි පරිදි නිමවී ඇත්දැයි පරීක්ෂා කිරීම මගේ රාජකාරිය විය. 2015 දී තනතුර වෙනස් කර, කණ්ඩායම් සාමාජිකාවන් දස දෙනෙකුගේ දිනක නිෂ්පාදන ඉලක්ක සපුරා ගන්නා ආකාරය විමසමින් ඒ අයට සහාය වීමට අවස්ථාව ලැබුණි. ඒ කඩඉමද සමත්වූ නිසා 2017 දී Module දෙකක වගකීම භාරගෙන වැඩකිරීමට සිදුවුණි. එය තරමක් අභියෝගාත්මක විය. ඉන්පසු සමූහ කණ්ඩායම් නායිකාවක ලෙස උසස්වීමක් ලදිමි.

දැන් පෙරට වඩා වගකීම් වැඩි වුවත් ආර්ථිකය ශක්තිමත් විය. ඕනෑම වෘත්තීය අභියෝගයක් සතුටින් භාරගෙන ඉලක්ක හඹා ගොස් ජයග්‍රහණය ලැබීම මගේ අරමුණයි.

ඒ නිසා 2024 වසරේ Production Executive වරියකවීම අරමුණු කරගෙන සේවය කරමි. එම තනතුර ලබාගැනීමට නම් පුහුණුව, පළපුරුද්ද, කැපවීම, වගකීම් දැරීමේ හැකියාවද තිබිය යුතුය. ඒ අනුව මගේ ඉලක්කය සපුරා ගැනීම සඳහා නිරන්තරයෙන් TL/GL පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වීමට බලාපොරොත්තු වෙමි. ඊට අමතරව නායකත්ව පුහුණු වැඩසටහන් සඳහාද සහභාගි වෙමි. 3W, 8 Step, 5Why ආදී ව්‍යාපෘති කිරීම සඳහාද ඉදිරිපත් වෙමි. සෑම මසකම Kaizen 5 ක් බැගින් ලබා දීම, M/O training program නිම කිරීම සහ විවිධ Style සඳහා පහසු ක්‍රම සහ විධි සැලසුම් කරදීම උනන්දුවෙන් කරමි.

TL/GL පුහුණුවෙන් ලත් දැනුමත් ප්‍රායෝගිකව ප්‍රයෝජනයට ගත්තෙමි. මුල් කාලයේ ඉලක්ක සපුරාලීමේදී යම් පසුබැසීමට ලක්වුවත් මගේ පුහුණු අත්දැකීම් සාමාජිකාවන්ට ලබා දී ඔවුන් තුළ ධනාත්මක සිතුවිලි වර්ධනය කර, මනා කාර්යක්ෂමතාවයෙන් යුත් කණ්ඩායමක් නිර්මාණය කළෙමි. ඒ නිසාම සෑම මාසයකම ඵලදායීතා කණ්ඩායම ලෙස තේරී, රුපියල් හයදාහකට වැඩි දිරි දීමනාවක්ද ලබාගත්තෙමු.

මගේ පෞද්ගලික ජීවිතයේද විවිධ ඉලක්ක තබාගෙන කටයුතු කිරීම පුරුද්දකි. 2022 දී මගේ සැමියා ඉතාලියේ රැකියාවකට යැවීම එක අරමුණක් විය. එය ඉටුකර ගතිමි. 2023 දී මා මිළට ගත් අක්කර තුනක ඉඩමේ කුරුඳු වගාකිරීම ද කර අවසන්ය. දැන් මගේ අනෙක් ඉලක්කය 2025 ජනවාරි වනවිට නිවසේ ඉදිකිරීම් නිම කර එහි පදිංචි වීමයි.

ආයතනයෙන් ලබාදුන් සාරි ජැකට් මැසීමේ පාඨමාලාව ප්‍රායෝගිකව ප්‍රයෝජනයට ගෙන නිවසේ මැහුම් ව්‍යාපාරයක් ආරම්භ කළෙමි. එය දියුණු කර සේවිකාවන් කීපදෙනෙකු බඳවාගෙන ව්‍යාපාරය පුළුල් කිරීම මීළඟ ඉලක්කයයි. ආගමික කටයුතුවලට සම්බන්ධ වීම, ක්‍රීඩා කටයුතු කිරීම මගේ දින චරියාවේම කොටසකි. වෘත්තීය වශයෙන් ඉහළට ගොස්, පෞරුෂත්වයකින් යුත් ආදර්ශමත් කාන්තාවක ලෙස පවුලේ ආර්ථික දියුණුව ඇතිකර ගැනීම පරම උත්සාහයයි.




**රසිකා දිසානායක**

MAS Active - Asialine



# රේණුකා: අඩු කාලයකින් වැඩි ඵලදායීතාවයක්

තිස්සමහාරාමය වැනි දුෂ්කර පළාතක සිට පානදුර ප්‍රදේශයට පැමිණියේ රැකියාවක් සොයාගැනීමේ මූලික අරමුණ ඇතිවයි. කාන්තාවක ලෙස මුල් කාලයේදී එය අභියෝගාත්මක වුවත් කල් යාමේදී මා ගත් දැඩි පියවර නිසාත් MAS සමූහ ව්‍යාපාරයේ Unichela ආයතනයට සම්බන්ධ වීමත් මට වාසනාව පාදා දුන් බව සහතිකයි. 2001 වසරේදී Team Member කෙනෙකු ලෙස පානදුර MAS යුනිචෙලා ආයතනයෙහි සේවයට බැඳුණෙමි. 2009 වසර වන විට Sample Maker වරියක වශයෙන් උසස්වීමක් ලබාදී MAS ආයතනයට ස්ථානමාරුවක්ද ලබාදුනි. තත්ත්වයෙන් උසස් Sample නිමකිරීම මගේ කාර්යය විය. 2019 වසර වන විට PEC අංශයේ සේවය කරමින් Sample Maker-Pro තනතුර දරමින් Sample නිම කිරීමට නව ක්‍රම සහ කාර්යක්ෂමතාව වැඩි කිරීමට නව ක්‍රම නිර්මාණය කළෙමි. ආයතනය තුළදී සම්මත මැහුම් දත්ත පුහුණුවද, අරමුණු පුහුණුවද, මැෂින් වර්ග සහ ඇමුණුම් වර්ග පිළිබඳව පුහුණුවද ලැබීමට මට අවස්ථාවක් ලැබුණි. සම්මත මැහුම් දත්ත පුහුණුව මගින් අඩු කාලයකින් තත්ත්වයෙන් උසස් නිමැවුමක් නිපදවන ආකාරයත්, යොදවන මැෂින් ප්‍රමාණය සහ අඩු ශ්‍රම දායකත්වයකින් එය ඉටුකිරීමටද දැනුමක් ලැබුවෙමි. S.M.V. අඩුකර උසස් තත්ත්වයේ නිෂ්පාදන කිරීම සඳහාද පුහුණුවක් ලබාගතිමි.

මම විවාහ වී Unichela ආයතනයේ සේවයට බැඳුණෙමි. ඉන්පසු දරුවන් දෙදෙනෙක් ලැබුණා. විවාහ වූ අලුත අපි කුලී නිවසක සිටියත් දැන් අපටම කියා නිවසක් තනාගැනීමට හැකිවී තිබෙනවා. එම නිවස තට්ටු තුනකින් යුක්තව නිමකර ගත්තේ එමගින් අමතර ආදායමක් ඉපැයීමේ අරමුණකිනි. දරුවන්ගේ අධ්‍යාපන කටයුතු දියුණු කර ගන්නත්, අපේ පෞද්ගලික දියුණුවත් ඇතිකර ගැනීම සඳහාත් ඇඳ ඇතිරිලි සහ කොට්ටඋර මැසීමේ සහ ගෙවතු වගාවද ආරම්භ කර තිබෙනවා.

සමාජයට යම් සේවයක් කිරීමට මා තුළ දැඩි කැමැත්තක් වූ බැවින් විශේෂයෙන්ම කාන්තාවන් සවිබල ගැන්වීමට මම උත්සාහ කරමි. ඒ අනුව යමින්, කාන්තාවන් දෙදෙනෙක් ස්වයං රැකියා අරඹා ඇති අතර ඔවුහු ආර්ථික ලාභ ලබමින් සිටිති. කොවිඩ් වසංගත සමයේදී හැකි අයුරින් එම රෝගීන්ට උදව් උපකාර කිරීම් හා රෝහල්ගත කිරීම් සඳහා නොමඳව සහාය දුනිමි. එය ඔවුනට මහත් අස්වැසිල්ලක් විය.

2022 වසරේදී මීටර් 800 දිවීමේ තරගවලට සහභාගි වී ජයග්‍රහණ දිනා ගතිමි. කෙටි දුර මෙන්ම දිගු දුර දිවීමේ තරඟ සඳහාද මම ඉදිරිපත් වීමි.

කාන්තාවක් ලෙස පවුලේ යුතුකම් වගකීම් සමග රැකියාව සමබරව පවත්වාගෙන යාමේ හැකියාව මට ඇති අතර මගේ පවුලේ ඥාතීන්ටද එය පුහුණු කරවමි.
MAS ආයතනය සවිබල ගැන්වූ කාන්තාවන්ට සේවය කිරීම ආරක්ෂාකාරී ස්ථානයක් හා ඔවුනගේ දක්ෂතා වර්ධනයට හේතුවන ස්ථානයක් බව මම සමාජයට ඔප්පු කර පෙන්වා තිබෙනවා. තවද, අන් අයට ආදර්ශවත් වෙමින් ඔවුන් දිරිමත් කරමින් දැනුම, කුසලතා හා ආකල්ප දියුණු කරමින් MAS ආයතනය තුළ දිගු ගමනක් යාමට මම බලාපොරොත්තුව සිටිමි.




**රේණුකා ප්‍රියදර්ශනී**

MAS Intimates - MDS

